# <u>මහාචාර්ය සේනක බිබිලේ</u>

| | | |
|---|---|---|
| **විෂයය** | : | සිංහල භාෂාව හා සාහිත්‍යය |
| **ශ්‍රේණිය** | : | 10 |
| **වාරය** | : | තුන්වන වාරය |
| **නිපුණතාව** | : | **2.3** ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. |
| **නිපුණතා මට්ටම** | : | නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි. |
| **ඉගෙනුම් පල** | : | ● විවිධ විෂයන්ට අදාළ ලේඛන කියවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>● විවිධ ලේඛන කියවීමෙන් අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.<br>● පොත පත කියවීමෙන් පුළුල් කර ගත් වාක් කෝෂය භාෂා කාර්යයේ දී භාවිත කරයි.<br>● නිශ්ශබ්දව පොත පත කියවීම අගය කරයි. |

## <u>ක්‍රියාකාරකම් 1</u>

1) මෙම ලිපිය ලියූ ලේඛකයා නම් කරන්න.
2) සේනක විලියම් බිබිලේ දරුවා උපත ලැබූ වර්ෂය කුමක් ද ?
3) ඔහුගේ මවුපියන් කවුරුන් ද ?
4) සේනක බිබිලේ මහතා උපන් ප්‍රදේශය කුමක් ද ?
5) සේනක බිබිලේ සිසුවා ඉගෙනුම ලැබූ පාසල නම් කරන්න.
6) පාසල් කාලයේ දී එතුමාට සිදු වූ කනගාටුදායක සිදුවීම කුමක් ද ?
7) වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වූ සේනක බිබිලේ ගමට පැමිණෙන තුරු ගැමියන් බලා සිටියේ ඇයි ?

8) එතුමා සේවය කළ ප්‍රදේශ මොනවා ද ?

9) එතුමා විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් ලැබූ සම්මාන මොනවා ද ?

10) එතුමා සෞඛ්‍ය සේවා අධිකාරී තනතුර දැරූ ප්‍රදේශය කුමක් ද ?

11) සේනක බිබිලේට පර්යේෂණ නිබන්ධනය වෙනුවෙන් ලැබුණු උපාධිය කුමක් ද ?

12) එතුමා වෛද්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් පුද්ගලයෙකු බවට පත් වූයේ ඇයි ?

13) ඩයසිපැම් නැමති ඖෂධය විකුණනු ලැබූ වෙළඳ නාමය කුමක් ද ?

14) ඖෂධවේදය පිළිබඳ 1954 දී බිහිවූයේ කුමක් ද ?

15) ශ්‍රී ලංකාවට ගැළපෙන ලෙස තැනූ ඖෂධ ප්‍රතිපත්තිය හා සම්බන්ධ යෝජනා 2 ක් ලියන්න.

16) 1972 දී ඖෂධ ප්‍රතිපත්තිය නිසා ලංකාවට ලැබුණු වාසිය කුමක් ද ?

17) එතුමා ප්‍රථම වෛද්‍ය පීඨාධිපති ධූරය හෙබවූ විශ්වවිද්‍යාලය කුමක් ද ?

18) සේනක බිබිලේ ඇන්ක්ටැඩ් සංවිධානයේ ලබාගත් තනතුර කුමක් ද ?

19) එතුමාට ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීමට පැවරුණු රටවල් නම් කරන්න.

20) ඔහුට ජනතාව වෙනුවෙන් සේවය කිරීමට නොහැකි වූයේ ඇයි ?

21) සේනක බිබිලේ චරිතය පිළිබඳව දොස්තර හාටි සිදු කළ ප්‍රකාශය උපුටා දක්වන්න.

**<u>ක්‍රියාකාරකම් 2</u>**

1) සේනක බිබිලේ චරිතය මගින් අපට ගත හැකි ආදර්ශ පෙළ ගස්වන්න.

2) පාඩමට අදාළව ශ, ෂ, ස අක්ෂර සහිත වචන උපුටා දක්වන්න.

<u>වාර්තාකරණය</u>

**නිපුණතාව** : **7.0** භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **7.2** ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

**ඉගෙනුම් පල** : ● ප්‍රායෝගික ලේඛන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.

● ශිල්පීය ප්‍රයෝගානුකූල ව ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

● අදාළ ලේඛනයට යෝග්‍ය නිර්මාණාත්මක අංග භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**<u>ක්‍රියාකාරකම්</u>**

1) පුවත්පත් වාර්තාවක් යනු කුමක් දැයි කෙටියෙන් දක්වන්න.

2) පුවත්පත් වාර්තා වර්ග නම් කරන්න.

3) පුවත්පත් වාර්තා ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද ?

4) පහත සඳහන් පුවත්පත් වාර්තාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## ඇසළ පුන් පොහෝදා
## අනුරාධපුර ශ්‍රී දළදා පෙරහර වීදි සංචාරය කරයි



**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක හා අනුරාධපුර දිසා විශේෂ**

අනුරාධපුර ශ්‍රී දළදා පෙරහර ඇසළ පුන් පොහෝදා (23) සවස අනුරාධපුර පූද බිමෙහි ඇතුල් නුවර වීදි සංචාරය කෙරිණි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ නැගෙනහිර වාහල්කඩ අභියසින් ආරම්භ කළ පෙරහර ජය ශ්‍රී මහා බෝධි පෙත්මග, රුවන්මැලි මහා සෑ පෙත්මග ඔස්සේ ථූපාරාමය අසලින් අභයගිරි විහාර පූද බිම දක්වා ගමන් කිරීමෙන් පෙරහර අවසන් විය.

මෙවර පවතින කොරෝනා වයිරස ව්‍යාප්තියත් සමඟ සෞඛ්‍ය ආරක්ෂිත මාර්ගෝපදේශ අනුව පෙරහැර සංචාරය කෙරුණු අතර චාරිත්‍රානුකූලව පැවති පෙරහර විචිත්‍රවත් අංග කිහිපයකින් වර්ණවත් විය.

අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම සිරිනිවාස, රුවන්මැලි මහා සෑ විහාරාධිපති පූජ්‍ය පල්ලේගම හේමරතන යන නා හිමිවරු ප්‍රමුඛ මහා සංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, ඉඩම් ඇමති එස්.එම්. චන්ද්‍රසේන යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කළහ.

රුවන්මැලි මහා සෑ විහාරාධිපති පූජ්‍ය පල්ලේගම හේමරතන නාහිමි ප්‍රධාන උතුරුමැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, ඉඩම් ඇමැති එස්.එම්. චන්ද්‍රසේන යන මහත්වරුන් විසින් හස්තිරාජයා මත කරඬුව තැන්පත් කිරීමෙන් පසුව පැවති උත්සව සභාවෙන් අනතුරුව දළදා පෙරහර ආරම්භ කෙරිණි.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.පී.එස් කුමාරසිරි මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීහු රැසක්ද එක් වූහ.

**ඡායාරූපය - අනුරාධපුර අතිරේක**

i. මෙම පුවත්පත් වාර්තාවේ සිරස්තලය උපුටා දක්වන්න.

ii. මෙම පුවතට අදාළ ව ඇසළ පෙරහැර පවත්වා ඇත්තේ කවදා ද ?

iii. පෙරහැර ගමන් කළ ගමන් මාර්ගය කෙටියෙන් දක්වන්න.

iv. පෙරහැර පැවැත්වීමට මූලිකත්වය ගත් ස්වාමීන් වහන්සේලා කවුරුන් ද ?

v. මෙහි සඳහන් පරිදි හස්තිරාජයා මත කරඬුව තැන්පත් කළේ කවුරුන් දැයි දක්වන්න.

5) පහත සඳහන් මාතෘකා ඇසුරින් පුවත්පත් වාර්තා සකස් කරන්න.

i. පාසලේ පැවැත්වූ වාර්ෂික ක්‍රීඩා උත්සවයක්

ii. ඔබ ප්‍රදේශයේ පැවති අවුරුදු උත්සවයක්

iii. ශ්‍රී ලංකාවේ නිදහස් දින උත්සවය පිළිබඳ වාර්තාවක්

6) එදිනෙදා පුවත්පතක පළ වී ඇති වාර්තාවල සිරස්තල කිහිපයක් පෙළ ගස්වන්න.

<u>න්‍යාය පත්‍ර</u>

1) න්‍යාය පත්‍රයක් යනු කුමක් ද ?

2) න්‍යාය පත්‍රයක් සැකසීමේ අවශ්‍යතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

3) න්‍යාය පත්‍රයක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද ?

4) න්‍යාය පත්‍ර භාවිතා කරනු ලබන අවස්ථා කිහිපයක් සඳහන් කරන්න.

5) පහත සඳහන් න්‍යාය පත්‍රය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය**

| | | |
|---|---|---|
| ප.ව.2.15 | - | ආරාධිත අමුත්තන් අසුන් ගැනීම |
| ප.ව.2.30 | - | මංගල භේරී සංධ්වනිය හා පහන් දැල්වීම |
| ප.ව.2.40 | - | සමාරම්භක නර්තනය |
| ප.ව.2.45 | - | සාහිත්‍යවේදීන්ට සුබපැතුම්<br>සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ |
| ප.ව.2.55 | - | සාහිත්‍යවේදීන්ට සුබපැතුම්<br>ලේකම් - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| ප.ව.3.05 | - | නර්තනාංගය |
| ප.ව.3.10 | - | සම්මාන ප්‍රදාන ලේඛනය භාරදීම හා සුබපැතුම්<br>සභාපති - රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලය |
| ප.ව.3.20 | - | නර්තනාංගය |
| ප.ව.3.25 | - | සම්මාන ප්‍රදාන පළමු අදියර |
| ප.ව.4.00 | - | නර්තනාංගය |
| ප.ව.4.05 | - | සම්මාන ප්‍රදාන දෙවන අදියර |
| ප.ව.4.40 | - | නර්තනාංගය |
| ප.ව.4.45 | - | සාහිත්‍යවේදීන්ට සුබපැතුම්<br>සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා |
| ප.ව.4.55 | - | සම්මාන ප්‍රදාන තෙවන අදියර |
| ප.ව.5.30 | - | නර්තනාංගය |
| ප.ව.5.35 | - | ශුභාශිංසන<br>ජනාධිපතිතුමා |
| ප.ව.5.45 | - | සම්මාන හා සාහිත්‍යරත්න අභිධාන ප්‍රදානය |
| ප.ව.6.20 | - | සම්මාන ප්‍රදානෝත්සවයේ සමාප්තිය<br>ජාතික ගීය |

i. සාහිත්‍ය සම්මාන උත්සවයේ ආරම්භක කටයුතු සඳහා යොදා ගෙන ඇති කාලය කොපමණ ද ?
ii. සම්මාන ප්‍රදානයන් අදියර කිහිපයකට යොදා ගෙන ඇත්තේ ඇයි ?
iii. මෙම උත්සවයේ න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රධාන අංග පෙළ ගස්වන්න.
iv. උත්සවය ආරම්භයේ සිට අවසානය තෙක් ගතවී ඇති කාලය කොපමණ ද ?

6) පහත සඳහන් මාතෘකා යටතේ න්‍යාය පත්‍ර සකස් කරන්න.

i. වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය
ii. පාසලේ පවත්වන මාධ්‍ය දින උත්සවය
iii. බක්මහ උළෙලක

**පිළිතුරු**

## **ක්‍රියාකාරකම 1**

1) දෙනගම සිරිවර්ධන
2) 1920 / 1920 පෙබරවාරි 13
3) ● **මව -** සිල්වියා ජයවර්ධන
   ● **පියා -** බිබිල වලව්වේ චාල්ස් විලියම් බිබිලෙ
4) අහංගම කතළුව ප්‍රදේශයේ
5) මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ
6) ඉගෙනුම ලබන කාලයේ දී ඔහුගේ පියා මිය යෑම
7) එතුමාගෙන් බෙහෙත් ලබාගැනීමට
8) පස්සර, මඩොල්සිම, බිංගිරිය හා ලුණුගල ප්‍රදේශවල
9) වෛද්‍ය අංශයට පිදෙන රන් පදක්කම හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවට පිදෙන රන් පදක්කම
10) බිංගිරිය ප්‍රදේශය
11) පී. එච්. ඩී. උපාධිය
12) ඔහුගේ නායකත්වයෙන් බිහි වූ ජනතාවාදී ඖෂධ ප්‍රතිපත්තිය නිසා
13) වැලියම්
14) වෛද්‍ය විද්‍යාලයේ ඖෂධවේදය පිළිබඳ අධ්‍යයන අංශයක්
15) ● ලංකාවට අනවශ්‍ය බෙහෙත් වර්ග ගෙන්වීම නතර කිරීම.
   ● රාජ්‍ය ආයතනවලත් පෞද්ගලික අංශයේත් ඖෂධවලට ඖෂධීය හෙවත් නිල නාමය පමණක් යෙදීම.
   ● මෙරටට ඖෂධ ගෙන්වීම හා මෙරට ඖෂධ බෙදා හැරීම සම්පූර්ණයෙන් ම රජයේ ආයතනයකට පැවරීම.
   ● ලංකාවේ ඖෂධ නිෂ්පාදනය, තත්ත්ව පාලන අංශය සහ පර්යේෂණ අංශය දියුණු කිරීම.
   ● ඖෂධ ගැන විද්‍යාත්මක කරුණු විශ්වාස කටයුතු ලෙස වෛද්‍යවරුන්ට සහ සෞඛ්‍ය සේවාවන්හි යෙදී සිටින අයටත් මහජනතාවටත් ලබා දී ඔවුන් සතු දැනුම පුළුල් කිරීම.
16) රුපියල් ලක්ෂ 60ක විදේශ විනිමයක් ලංකාවට ඉතිරි වීම.
17) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
18) ජ්‍යෙෂ්ඨ ඖෂධ ප්‍රතිපත්ති විද්‍යාඥයා
19) ට්‍රිනිඩෑඩ්, ජැමෙයිකා, බාබේඩෝස්, ඩොමිනිකා, ග්‍රෙනාඩ්, ඇන්ටිගා, පුවටෝරිකෝ, ගයනා යන රටවල්
20) හදිසි හෘදයාබාධයකින් මියයාමට සිදු වූ නිසා
21) "ලංකාව කඳු මුදුනකි. සේනක බිබිලේ එහි බැබළෙන පහනකි."

## **ක්‍රියාකාරකම 2**

1) .
- සැමදෙනාට ම ආදරයෙන් කරුණාවෙන් සැලකීම.
- පන්ති කාමරයේ මෙන්ම ක්‍රීඩා, නාට්‍ය, සංගීත සන්දර්ශනවලදීත් ඉහළම දක්ෂතා දැක්වීම.
- ගම්වාසීන්ට ප්‍රජා සත්කාර කිරීම.

- වෛද්‍යවරයෙකු වශයෙන් බොහෝ පිරිසකට පිහිට වීම.
- නව ඖෂධ ප්‍රතිපත්ති සකස් කිරීමෙන් රටට මුදල් ඉතිරි කර දීම.

2) .

- භස්මාවශේෂ
- සන්දර්ශනවල
- කෘෂිකර්ම
- ශිෂ්‍යත්ව
- විෂයයන්
- මන්දපෝෂණය
- පරීක්ෂණයේ
- ශාරීරික
- ක්ෂේත්‍ර
- සමීක්ෂණයෙහි
- ඖෂධවේදය
- නිෂ්පාදන
- ජ්‍යෝෂ්ඨ
- විශේෂඥයා

<u>වාර්තාකරණය</u>

1) යම්කිසි සිදුවීමක් පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමේ ක්‍රමය

2) ● රැස්වීම් වාර්තා

● වැදගත් සිදුවීම් වාර්තා

● විචාරාත්මක වාර්තා

● විශේෂාංග වාර්තා

3) ● සිදුවී ඇත්තේ කුමක් ද ?
● සිදුවීමට මුල් වූ අය
● සිදුවීම සිදු වූයේ කවදා ද ?
● සිදුවීම සිදු වූයේ කොහේ ද ?
● සිදුවීම සිදු වූයේ ඇයි ?
● සිදුවීම සිදු වූයේ කෙසේ ද ?

4) .

i. "ඇසළ පුන් පොහෝදා අනුරාධපුර ශ්‍රී දළදා පෙරහැර වීදි සංචාරය කරයි"
ii. ඇසළ පුන් පොහෝදා
iii. අනුරාධපුර පුද බිමෙහි ඇතුල් නුවර වීදිවල සංචාරය කිරීම.

iv. අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම සිරිනිවාස, රුවන්මැලි මහ සෑ විහාරාධිපති පල්ලේගම හේමරතන නාහිමිවරු
v. උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් හා ඉඩම් ඇමති එස්. එම්. චන්ද්‍රසේන යන මහත්වරුන්

5) .
i. ආරාධිත අමුත්තන්, නිවාසාන්තර තරග, සරඹ සන්දර්ශන, තූර්යවාදන සන්දර්ශන, ආරම්භ කළ හා අවසන් කළ වේලාව, විශේෂ සිදුවීම්, ජයග්‍රහණ යනාදිය පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න.
ii. පැවැත්වූ දිනය, වේලාව, ස්ථානය, සහභාගීත්වය, තරග පැවැත්වීම්, තරගකරුවන් විනිශ්චය, ජයග්‍රහණ, විශේෂ අවස්ථා යනාදිය පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න.
iii. නිදහස් දින උත්සවයේ අරමුණු, පැවැත්වූ දිනය, ස්ථානය, සහභාගීත්වය, අමුත්තන්, විශේෂ හමුදා පෙළපාලි, සන්දර්ශන යනාදිය පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න.

6) .
- රුහුණු කතරගම අවසන් රන්දෝලි පෙරහැර
- වසර 24කට පසු ගුරු - විදුහල්පති වැටුප් විසමතා ඉවත් වෙයි.
- ඉන්දියාවට වඩා ඉහළ දස්කම් දැක්වූ මල්කා ජිම්නාස්ටික් බලාපොරොත්තු ඉහළ දමයි.
- කොරෝනා රෝගීන්ගේ වැඩිවීමක්
- පාසල් ආරම්භය කල්යයි.
- පළාත් අතර සංචරණ සීමා පැනවේ.
- බස්නාහිර පළාතේ එන්නත්කරණ වැඩසටහන කඩිනමින්
- නිරෝධායන නීති කඩ කරන්නන් අත්අඩංගුවට
- ඔලිම්පික් යන ලාංකික ක්‍රීඩා සම්පත්

<u>න්‍යාය පත්‍ර</u>

1) කාලය කළමනාකරණය කරමින් යම්කිසි විශේෂ අවස්ථාවක අනුපිළිවෙළින් පෙළ ගස්වන සැලැස්ම
2) කාලය කළමනාකරණය කරගත හැකිය.
3) ● වැඩසටහනකට ලබා දෙන කාලය
● වැඩසටහනක ආරම්භය හා අවසානය අතර කාලය පිළිබඳ සැලකිළිමත් වීම.
4) ● ත්‍යාග ප්‍රදානෝත්සවය
● නිවාසාන්තර ක්‍රීඩා උත්සව
● විශේෂ රැස්වීම්

5) .
i. විනාඩි 25
ii. අදියර 3 ක්
iii. ● සමාරම්භය
● නර්තන වින්‍යාසයක්

- සුබ පැතුම්
- සම්මාන ප්‍රදානයන්
- ශුභාශිංසන
- අභිධාන ප්‍රදානය

iv. පැය 3යි මිනිත්තු 15ක කාලයක්

6) .

i.

වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2020

නාාය පත්‍රය

ප. ව. 2.00 - ආරම්භක අවස්ථාව
පිළිගැනීමේ කටයුතු
ආගමික වතාවත්
අසුන් ගැන්වීම්

ප. ව. 2.30 - පිළිගැනීමේ කතාව

ප. ව. 2.45 - වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.

ප. ව. 3.15 - ත්‍යාග ප්‍රදානය

ප. ව. 3.30 - විශේෂාංග (ගායන, වාදන, ...)

ප. ව. 3.40 - ත්‍යාග ප්‍රදානය

ප. ව. 3.55 - ප්‍රධාන අමුත්තාගේ කතාව

ප. ව. 4.15 - නර්තන අංගයක්

ප. ව. 4.25 - ත්‍යාග ප්‍රදානය

ප. ව. 4.45 - ආදිශිෂ්‍ය සංගමයේ කතාව

ප. ව. 5.00 - විශේෂ ආරාධිත කතාව

ප. ව. 5.15 - සංගීත අංශයේ ගායනයක්

ප. ව. 5.25 - ස්තුති කතාව

ii.

මාධ්‍ය දින වැඩසටහන 2020

නාාය පත්‍රය

ප. ව. 1.00 - අමුත්තන් පිළිගැනීම.
පොල්තෙල් පහන දැල්වීම.

ප. ව. 1.15 - සරස්වතී අභිනන්දන රංගනයක්

ප. ව. 1.30 - පිළිගැනීමේ කතාව

ප. ව. 1.45 - අරමුණ පැහැදිලි කිරීම.

ප. ව. 1.55 - විදුහල්පතිතුමාගේ කතාව (මාධ්‍ය දිනය)

ප. ව. 2.15 - මාධ්‍ය දින තරගාවලියේ ජයග්‍රහන ඇගයීම (කුසලතා)

ප. ව. 2.30 - විශේෂාංගයක් (සමූහ නැටුම)

ප. ව. 2.45 - විශේෂ දේශනය

ප. ව. 3.15 - මාධ්‍ය දින තරගාවලියේ ජයග්‍රහන ඇගයීම (ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන)

ප. ව. 3.30 - විනිශ්චය මණ්ඩලයේ කතාව (මාධ්‍ය දින තරගාවලිය පිළිබඳ)

ප. ව. 3.45 - විනිශ්චය මණ්ඩලය සඳහා සමරු තිළිණ ප්‍රදානය

ප. ව. 4.00 - ස්තුති කතාව